# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ

## පුවත්පත් නිවේදනය

## මහ කොමසාරිස්තුමා දමිළ ප්‍රගතිශීලී සන්ධානයේ නියෝජිත පිරිසක් හමු වේ

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මනෝ ගනේෂන් මැතිතුමා ප්‍රමුඛ දමිළ ප්‍රගතිශීලී සන්ධානයේ (TPA) නියෝජිත පිරිසක් අද දින (2021 ජූලි 06) ඉන්දියා හවුස් හිදි මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා හමු විය. දමිළ ප්‍රගතිශීලී සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු රාධා ක්‍රිෂ්ණන්, ගරු උදය කුමාර්, ගරු වේලු කුමාර් සහ දමිළ ප්‍රගතිශීලී සන්ධානයේ මහ ලේකම් චන්ද්‍ර චෆ්ටර් යන මහත්වරු මෙම හමුව සඳහා සහභාගී වූහ. මහ කොමසාරිස්තුමා සමඟික් නියෝජ්‍ය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා සහ දේශපාලන අංශ ප්‍රධානී භානු ප්‍රකාශ් මහත්මිය ද මේ සඳහා සහභාගී වූහ.

2. පැය දෙකකට ආසන්න කාලයක් පැවති මෙම හමුවේදී අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන කාලීන කරුණු පිළිබඳව සාකච්ඡා කෙරුණු අතර ඉන්දියානු සම්භවයක් සහිත දමිළ ප්‍රජාවට බලපාන කරුණු ද ඒ අතර විය. මෙහිදී දමිළ ප්‍රගතිශීලී සන්ධානයේ නියෝජිත පිරිස විසින් ඉන්දියානු සම්භවයක් සහිත දමිළ ජනතාවගේ සමාජ-ආර්ථික සහ සංවර්ධන අවශ්‍යතා සහ දේශපාලන බලය බෙදීමක් සඳහා ඔවුන් සතු අපේක්ෂාවන් පිළිබඳව සඳහන් කරන ලදී. 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහ පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීම යන පදනම මත ශ්‍රී ලංකාවේ බලය බෙදීම සඳහා ඉන්දියාවේ සහයෝගය මහ කොමසාරිස්තුමා අවධාරණය කළේය. ඉන්දියානු රජය විසින් වතුකරයේ ක්‍රියාත්මක කරනු ලබන ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය සහ වෙනත් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතීන් හි වැදගත්කම ද දෙපාර්ශවය විසින් අවධාරණය කරන ලදී.

*****

2021 ජුලි 6
කොළඹ